# සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ආයුර්වේද වෛද්‍ය සභාව

# වාර්ෂික වාර්තාව - 2024



# පටුන


| | |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර, පරමාර්ථය හා අභිමතාර්ථ | 04 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය | 05 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් - 2024 | 06-07 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය | 08 |
| **ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය** | |
| මූල්‍ය සම්පාදනය | 09 |
| ප්‍රතිපත්ති සම්පාදනය, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීම | 10 |
| විමර්ශන කටයුතු | 11 |
| 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති ප්‍රකාරව පාරම්පරික, ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම. | 12-14 |
| ආයුර්වේද වෛද්‍ය සභා නිල වෙබ් අඩවිය, වෛද්‍ය ලියාපදිංචිය අලුත් කිරීම. | 15 |
| ආයුර්වේද සාත්තු සේවකයින් හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම, ආයුර්වේද වෛද්‍ය සභාවේ මානව සම්පත්, වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණ වලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර | 16 |
| 2024 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 19 |
| 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 20 |
| 2024 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 21 |
| 2024 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 22 |
| 2024 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් පත්‍රය | 23-31 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 32-37 |
| සංස්ථාපිත තොරතුරු | 38 |
| ස්තුතිය | 39 |

## දැක්ම

ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා ආයුර්වේදය

## මෙහෙවර

වෘත්තීය ආචාරධර්මවලට අනුගත වෙමින් උපරිම සෞඛ්‍ය සේවාවක් සලසමින් ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

## පරමාර්ථය

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි විධිවිධානවලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත වෘත්තිකයින් වෙත නෛතික අධිකාරිත්වය පිරිනැමීම සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

**අභිමතාර්ථ ( ක්‍රියාකාරකම් )**

1. 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති වගකීම් ක්‍රියාත්මක කිරීම

   i. ආයතනික උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම (BAMS/ BSMS/ BUMS)

   ii. ආයුර්වේද ශාස්ත්‍රී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

   iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉන්දියානු විශ්ව විද්‍යාලයක විදේශ සුදුසුකම්ලත් වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.

   iv. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

   v. ආයුර්වේද හෙද නිලධාරීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම,

   vi. ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම,

   vii. ආයුර්වේද සම්භාහන ශිල්පීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම

2. ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම.
3. ආයුර්වේද වෛද්‍යවරුන්/ හෙද නිලධාරීන්/ ඖෂධවේදීන්/ සම්භාහන ශිල්පීන්ගේ වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම
4. වෙබ් අඩවිය යාවත් කාලීන කිරීම.
5. විශේෂිත වැඩසටහන් (වෘත්තිය සංවර්ධන වැඩසටහන්)
6. ආයුර්වේද වෛද්‍ය සභාවේ භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
7. ආයුර්වේද වෛද්‍ය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
8. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම කාර්යාල පැවැත්වීම

   i. මිත්‍රශීලී සේවාවක් තුළින් දේශීය වෛද්‍ය ක්‍රමය සුරක්ෂිත කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් ආයුර්වේද විෂයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්, ආයුර්වේද සංරක්ෂණ සහා ලියාපදිංචි හා ලියාපදිංචිය අපේක්ෂිත තැනැත්තන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

   ii. ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් වරින්වර ගනු ලබන තීරණ පිළිබඳව ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

<u>**1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය**</u>

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශයක් අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. පසුව 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ යළිත් ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1977අංක 07 දරන සංශෝධන හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අනුව සංශෝධනය වී 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය**

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද හෙද හෙදියන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈඅ). ආයුර්වේද සම්භාහන ශිල්පීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.


(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1.ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද හෙද හෙදියන්, ආයුර්වේද ඖෂධවේදීන් සහ ආයුර්වේද සම්භාහන ශිල්පීන්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,

2. ඉහතින් සඳහන් (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

**1961 අංක 31 දරන ආයුර්වේද පනතේ "ආයුර්වේදය" යන්න පහත සඳහන් ආකාරයෙන් අර්ථ දක්වා ඇත.**

**"ආයුර්වේදය"** යන්නට ආයුර්වේද, සිද්ධ හා යුනානි හා දේශීය චිකිත්සා ක්‍රමවල වෛද්‍ය කර්මය හා ශල්‍ය කර්මය ද වෙනත් යම් ආසියාතික රට රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් ප්‍රතිකාර ක්‍රමද ඇතුළත් වේ.



## 1961 අංක 31 දරන පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාව

1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අනුව ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

(අ). ආයුර්වේද කොමසාරිස්වරයා ( සභාපති )

(ආ). ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපති,

(ඇ). ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ ආචාර්යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයන් එක් එක් සාමාජිකයෙකු වශයෙන් සාමාජිකයින් සිව් දෙනකු,

(ඈ). අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත් කර ගනු ලැබූ එක් සාමාජිකයකු

(ඉ). ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරෙන් තෝරාපත් කර ගනු ලැබූ සාමාජිකයන් තුන් දෙනෙකු ; හා

(ඊ). ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් දොළොස් දෙනෙකුට වැඩි නොවන ගනනක්, ඔවුන් අතර

(i). ලියා පදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් නොවන තැනැත්තන් අතරෙන් තුන්දෙනෙකු,

(ii). සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමය විසින් නම් කෙරෙන දස දෙනෙකුගෙන් යුත් මණ්ඩලයකින් තුන්දෙනෙකු,

(iii). සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනයේ සාමාජිකයන් නොවන ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන්ගෙන් දෙදෙනෙකු,

(උ). අවස්ථානෝචිත පරිදි, මුදල් හෝ භාණ්ඩාගාර විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද පරිදි පත් කරනු ලබන එක් සාමාජිකයෙකු විය යුතුය.



## 2024 වර්ෂයේ 23 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්

1. ආයුර්වේද කොමසාරිස් ජනරාල්, වෛද්‍ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන මයා - සභාපති
2. පූජ්‍ය බෙංගමුවේ නාලක හිමි - සාමාජික
3. පීඨාධිපති, මහාචාර්ය පතිරගේ කමල් පෙරේරා මහතා - සාමාජික
   දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
4. පීඨාධිපති, ආචාර්ය වසන්තා ජානකී වික්‍රමාරච්චි මිය - සාමාජික
   දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය
5. පීඨාධිපති, වෛද්‍ය වී. අනවරදන් මහතා, සිද්ධ වෛද්‍ය පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය - සාමාජික
6. අංශ ප්‍රධාන, ජ්‍යෙ.කථි.වෛද්‍ය විවියන් සත්‍යශීලන් මිය - සාමාජික
   සිද්ධ වෛද්‍ය ඒකකය, යාපනය විශ්ව විද්‍යාලය
7. අධ්‍යක්ෂ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ඩී.එල්.ඩී.පී. අංජන ලියනගේ මහතා - නිරීක්ෂක
   (2024.08.13 දින සිට)
8. අධ්‍යක්ෂ, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, කේ.පී.ආර්. ප්‍රනාන්දු මහතා මහතා - නිරීක්ෂක
   (2024.07.09 දක්වා)
9. ආචාර්ය, වෛද්‍ය එම්.ඩබ්.එස්. ජේ.කුමාරි මෙය, දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය - උප සභාපති
10. මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා මහතා, දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය - සාමාජික
11. ජ්‍යෙ.කථි.වෛද්‍ය වී. ෂන්මුගරාජා මෙය, සිද්ධ වෛද්‍ය ඒකකය, යාපනය විශ්ව විද්‍යාලය - සාමාජික
12. ආචාර්ය එච්.පී. වක්කුඹුර මිය - සාමාජික
    දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය
13. ජ්‍යෙ.කථි.වෛද්‍ය එස්. උෂාකාන්තන් මහතා, සිද්ධ වෛද්‍ය පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය- සාමාජික
14. වෛද්‍ය එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු මයා - සාමාජික
15. වෛද්‍ය ඒ.ඇම්.හීංනිලමේ මයා - සාමාජික
16. වෛද්‍ය ඩී.පී.ඩී.ජී.විජේරත්න මයා - සාමාජික
17. වෛද්‍ය පී.කේ.එච්. ධර්මවිජය මහතා - සාමාජික
18. වෛද්‍ය ඒ.එම්.ඩී. සුමනරත්න අමරතුංග මහතා - සාමාජික
19. තුෂාර සෙනරත් පෙරේරා මහතා - සාමාජික
20. යූ.ඩී.එස්.ඩබ්ලිව්.බණ්ඩාර මයා (2024.02.13 දක්වා) - සාමාජික
21. වෛද්‍ය පී.වී.එස්.පී.කේ.විතානගේ මයා ( 2024.02.13 සිට) - සාමාජික
22. වෛද්‍ය පතිරාජ විනීතා කල්‍යාණි මිය - සාමාජික
23. වෛද්‍ය නිමල් ක්‍රිස්ටෝපර් වර්ණකුළසූරිය මයා - සාමාජික
24. වෛද්‍ය එච්.එම්.සෙනරත් ජයසූරිය බණ්ඩාර මයා (2024.04.09 දක්වා) - සාමාජික
25. වෛද්‍ය එච්.ඩබ්. ආරියරත්න වඩුගේ මයා ( 2024.05.07 සිට) - සාමාජික
26. වෛද්‍ය එච්.බී.කේ. අජිත් කුමාර මහතා ( 2024.11.30 දක්වා) - ලේඛකාධිකාරී

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් 10 ක් පවත්වා ඇත.

## ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය

| | සංඛ්‍යාව | |
|---|---|---|
| සභාපති | 01 | 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතේ 11(1)(අ) අනුව |
| ආයුර්වේද වෛද්‍ය සභාව | 26 | 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතේ 11(1)(ආ) සිට (උ) වගන්ති අනුව |
| ලේඛකාධිකාරී | 01 | 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතේ 19(1)(අ) වගන්තිය අනුව |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | 01 | 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතේ 19(1)(ආ) වගන්තිය අනුව |
| කළමනාකරණ සහකාර - 10<br>ලේඛන භාරකරු 01 | 11 | |
| කාර්යාල කාර්ය සහායක | 01 | |
| කාර්යාල කම්කරු | 02 | |

# ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2024

## 01. මූල්‍ය සම්පාදනය

2024 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ හැත්තෑ දෙකක **(7,200,000/-)** මුදලක් රජයේ ප්‍රදාන වශයෙන් වෙන්වී තිබුණද ආයුර්වේද වෛද්‍ය සභාව ස්වාධීනව පවත්වාගෙන යාම අරමුණු කර ගනිමින් 2024 වර්ෂයේ රජයේ ප්‍රදාන ලෙස ලබා ගත් **රු.3,600,000/-** ක මුදල නැවත ආයුර්වේද දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව රජයේ ප්‍රදාන වලින් තොරව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

**2024** වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මඟින් ලැබූ ආදායම රු.**18,345,758/-** ක් වූ අතර මුළු වියදම රු **18,564,387/-** ක් විය. 2024 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් ද 2024.12.31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2024 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ තත්ත්වය මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇත.


වගු අංක 1.1

**වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රදාන**

| අයිතමය | 2023 රුපියල් | 2024 රුපියල් |
|---|---|---|
| **රජයේ ප්‍රදාන** | 5,346,000.00 | 0.00 |
| **උපයාගත් ආදායම** | 18,922,783.00 | 18,345,758.00 |
| **මුළු ලැබීම්** | **24,268,783.00** | **18,345,758.00** |

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2023 හා 2024 වර්ෂයන් හි රජයේ ප්‍රදාන හා අනෙකුත් ආදායම් ප්‍රස්ථාරයේ දැක්වේ.

ප්‍රස්ථාර අංක 1.1




වගු අංක 1.2


**වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රදාන 2020-2022**

| අයිතමය | 2020 රුපියල් | 2021 රුපියල් | 2022 රුපියල් |
|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | 6,000,000.00 | 7,200,000.00 | 7,200,000.00 |
| **උපයාගත් ආදායම** | 6,183,476.81 | 5,633,507.25 | 12,704,690.61 |
| **මුළු ලැබීම්** | **12,183,476.81** | **12,833,507.25** | **19,904,690.61** |

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ ප්‍රදාන හා අනෙකුත් ආදායම් ප්‍රස්ථාරයේ දැක්වේ.

ප්‍රස්ථාර අංක 1.2

රුපියල්



## 02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ස්ථාවර අනුකමිටු වශයෙන් පහත සඳහන් කමිටු ක්‍රියාත්මක කරනු ලබයි.

I. දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව
II. අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනු කමිටුව

ලියාපදිංචිය අපේක්ෂිත පාරම්පරික ආයුර්වේද සහ සිද්ධ අයැදුම්කරුවන් සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය 2021.08.10 දින පවත්වන ලද 21 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ 11 වන රැස්වීමේ දී ගන්නා ලද තීරණය අනුව ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරන ලදී. ඒ අනුව 2024 අප්‍රේල් මස 06 හා 07 වන දෙදින කොළඹ 05, ලුම්බිනි විද්‍යාලයේ දී පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ අවසාන ප්‍රතිපල 2024.08.26 වන දින ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ලබා දී ඇත.

ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවූ සංඛ්‍යාව 348

ලිඛිත පරීක්ෂණය සඳහා පැමිණි සංඛ්‍යාව 253

ලිඛිත පරීක්ෂණය සඳහා නොපැමිණි සංඛ්‍යාව 95

| ආයුර්වේද/සිද්ධ | සර්වාංග | භෛෂජ්‍ය | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|---|
| සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද | 38 | 81 | 119 | 123 |
| සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ | 02 | 02 | 04 | |
| ඌණ සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද | 23 | 28 | 51 | 57 |
| ඌණ සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ | 03 | 03 | 06 | |
| අසමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද | 32 | 34 | 66 | 71 |
| අසමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ | 05 | - | 05 | |
| විභාග අක්‍රමිකතා හේතුවෙන් ප්‍රතිපල අත්හිටුවා ඇති අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද/ සිද්ධ | 01 | 01 | 02 | 02 |
| නොපැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව - ආයුර්වේද | 55 | 34 | 89 | 95 |
| නොපැමිණි අයැදුම්කරුවන් සංඛ්‍යාව - සිද්ධ | 05 | 01 | 06 | |
| මුළු එකතුව | **164** | **184** | **348** | **348** |

2024 වර්ෂයේ දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව රැස්වී නොමැත.

### ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම ලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකයක් දැරීමටත් සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමටත් එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත් නෛතික හිමිකම තහවුරු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සභා තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුම්වත් කර තිබේ. 2024 වර්ෂයේ දී ලියාපදිංචි වෛද්‍යවරුන් **22** දෙනෙකුගේ අතිරේක සුදුසුකම් සභාව විසින් අනුමත කර ඇත.

**වගු අංක 2.1**

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව | **08** | **21** | **09** | **11** | **22** |

## 03. විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තිය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවී ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තිය විෂමාචාර, ආයුර්වේද ආචාරධර්ම වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණවේ. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම් පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගැනේ. 2023 වර්ෂයේ දී ලැබී ඇති පැමිණිලි 14 සම්බන්ධව විමර්ශනය කර අවසන් කර ඇති අතර 2024 වර්ෂයේ ලැබුණු පැමිණිලි 11 ක් ලැබී ඇති අතර ඉන් 03 ක විමර්ශන කටයුතු අවසන් කර ඇත.

**වගු අංක 3.1**

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| විමර්ශනය සඳහා ලැබී ඇති සංඛ්‍යාව | 100 | 50 | 25 | 15 | 11 |
| විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 93 | 46 | 25 | 14 | 03 |
| අවසන් කර ඇති පැමිණිලි ප්‍රතිශතය | 93% | 92% | 100% | 93% | 27% |

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවූ වෛද්‍යවරුන් සම්බන්ධව ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 69 යටතේ සාමාන්‍ය නීතිය යටතේ කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත යොමු කර ඇති අතර එම විමර්ශන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ලබා දියයුතු සහයෝගය 2024 වර්ෂයේ දී ලබා දී ඇත.

2019-2022 කාලසීමාවට අදාළව ඉතිරි වී ඇති පැමිණිලි 17 සම්බන්ධයෙන් පැමිණිලි කරුවන් විසින් කිසිදු පසු විමසීමක්ද සිදුකර නොමැති බැවින්ද, විමර්ශණයට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින්ද, විධිමත්ව නොලැබුණු පැමිණිලි බැවින්ද එම පැමිණිලි බහා තැබීමට සුදුසු බව 2024.02.13 දින සභාව විසින් තීරණය කරන ලදී.

ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සහ මරණ සහතික සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සකස් කිරීමට කටයුතු කරන ලදී.

2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7 (ඊ) වගන්තිය අනුව ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය කටයුතු සහ ක්‍රියාකාරකම් නියාමනය කිරීම මඟින් ඉහළ වෘත්තීය ප්‍රමිති සහතික කිරීම යන පනතේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මම මාර්ගෝපදේශ සකස් කර ඇත. ඒ අනුව, උක්ත පනතේ 19 සහ 50 වගන්ති අනුව කියවිය යුතු 18 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සාදන මෙම මාර්ගෝපදේශ 2024.09.10 දින ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් අනුමත කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන ලදී.

## 04. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1) හා 55(2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සිදු කරයි.

1. ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥානපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම.
2. ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව වාචික පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

වගු අංක 4.1

### 2020 සිට 2024 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය වරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල පිළිබඳ සටහන

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | 03 | 24 | 27 | 29 | 29 |
| වාර්ෂිකව වාචික පරීක්ෂණය සඳහා කැඳවන ලද අයැදුම්කරුවන් සංඛ්‍යාව | 37 | 338 | 422 | 416 | 432 |
| වාර්ෂිකව වාචික පරීක්ෂණය සඳහා සහභාගී වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 30 | 281 | 329 | 336 | 332 |
| වාචික පරීක්ෂණ මඟින් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 10 | 180 | 136 | 151 | 103 |
| **සහභාගී වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වූ ප්‍රතිශතය** | 33.33% | 64.06% | 41.33% | 44.94% | 31.02% |

වගු අංක 4.2

### 2024 වර්ෂයේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද වාචික පරීක්ෂණ මණ්ඩල පිළිබඳ පළාත් සටහන

| පළාත | වාචික පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | කැඳවූ සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මධ්‍යම | 03 | 41 | 32 | 08 |
| දකුණ | 03 | 38 | 28 | 05 |
| ඌව | 02 | 23 | 20 | 11 |
| බස්නාහිර | 12 | 187 | 132 | 41 |
| වයඹ | 03 | 57 | 51 | 15 |
| සබරගමුව | 04 | 63 | 49 | 13 |
| උතුරු මැද | 02 | 23 | 20 | 10 |
| එකතුව | 29 | 432 | 332 | 103 |

2024 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව **27,644** කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් **439** දෙනෙකු පහත සඳහන් අංශ අනුව ලියාපදිංචි කර ඇත.

වගු අංක 4.3

## 2020 සිට 2024 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂිකව ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | 258 | 77 | 348 | 425 | 350 |
| **උපාධිධාරීන්** | 250 | 32 | 283 | 313 | 280 |
| 1. ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | 101 | 11 | 146 | 132 | 117 |
| 2. ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය | 75 | 04 | 65 | 86 | 60 |
| 3. යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | 47 | 03 | 35 | 45 | 39 |
| 4. සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- සිද්ධ වෛද්‍ය ඒකකය, යාපනය විශ්ව විද්‍යාලය | 26 | - | 32 | 34 | 36 |
| 5. සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- සිද්ධ වෛද්‍ය පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය | 01 | 13 | 05 | 15 | 28 |
| 6. ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- ඉන්දියාව | - | 01 | - | 01 | - |
| **ඩිප්ලෝමාධාරීන්** | 01 | 18 | 18 | 30 | 37 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 01 | 10 | 05 | 21 | 37 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | - | 08 | 13 | 09 | - |
| **පාරම්පරික - සර්වාංග** | 07 | 27 | 47 | 82 | 33 |
| පාරම්පරික | 07 | 27 | 47 | 82 | 33 |
| **පාරම්පරික - විශේෂ** | 20 | 45 | 119 | 130 | 89 |
| සර්ප විෂ | 06 | 04 | 25 | 30 | 13 |
| කැඩුම් බිඳුම් | 13 | 25 | 64 | 76 | 63 |
| අක්ෂි රෝග | - | 05 | 04 | 04 | 02 |
| චර්ම රෝග | - | 04 | 10 | 11 | 07 |
| ගෙඩිවණ | 01 | 01 | 05 | 07 | 02 |
| ජලභීතිකා | - | 01 | - | - | - |
| දැවුම් පිළිස්සුම් | - | 02 | 04 | - | 02 |
| විදුම් පිළිස්සුම් | - | - | 01 | - | - |
| මානසික | - | 03 | 06 | 02 | - |
| **මුළු එකතුව ( සර්වාංග / විශේෂ )** | 278 | 122 | 467 | 555 | 439 |

වගු අංක 4.4

## 2024-12-31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2024-12-31 දිනට මුළු වෛද්‍යවරු සංඛ්‍යාව |
|---|---|
| (1) මුළු ලියාපදිංචි සංඛ්‍යාව සාමාන්‍ය (සර්වාංග) A+B+C | 17,126 |
| A. උපාධිධාරීන් | 4,282 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | 2,065 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය | 1,001 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- දේශීය වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය | 573 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- සිද්ධ වෛද්‍ය ඒකකය, යාපනය විශ්ව විද්‍යාලය | 514 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- සිද්ධ වෛද්‍ය පීඨය, නැගෙනහිර විශ්ව විද්‍යාලය | 117 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය- ඉන්දියාව | 12 |
| B. ඩිප්ලෝමාධාරීන් | 5,828 |
| එල්.ඒ.එම්.එස්. - කල්කටා | 95 |
| එෆ්.එම්.බී.එස්. - අහලමාබාද් | 04 |
| එම්.එල්.එම් - ඉන්දියා | 01 |
| ඩී.අයි.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 584 |
| ඩී.ඒ.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 1,299 |
| ඩී.එස්.ඒ.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 1,189 |
| ඩී.ඒ.එස්.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 157 |
| එල්.ඒ.එම්. - යාපනය සිද්ධ විද්‍යාලය | 91 |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 635 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 1,525 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 248 |
| C. පාරම්පරික - සර්වාංග | 7016 |
| පාරම්පරික | 7016 |
| (2) මුළු ලියාපදිංචි සංඛ්‍යාව පාරම්පරික - විශේෂ | 10518 |
| සර්ප විෂ | 4091 |
| කැඩුම් බිඳුම් | 2978 |
| අක්ෂි රෝග | 756 |
| චර්ම රෝග | 393 |
| ගෙඩිවණ | 740 |
| ජලභීතිකා | 231 |
| දැවුම් පිළිස්සුම් | 98 |
| මානසික | 207 |
| විදුම් පිළිස්සුම් | 11 |
| වෙනත් | 1012 |
| මුළු එකතුව ( සර්වාංග / විශේෂ වෛද්‍යවරුන් ) – (1)+(2) | 27644 |
| ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් අතුරින් මියගොස් ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව - 2024.12.31 දිනට | 4110 |

## 05. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධව රාජ්‍ය අංශයේ ව්‍යාපාරික අංශයේ හා ප්‍රජාවගේ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා සහ ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි/ලියාපදිංචිය අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්ත්වයන් රාජ්‍ය අංශයේ, ව්‍යාපාරික අංශයේ හා ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව එළිදැක්වීම මෙම වෙබ් අඩවියෙන් අපේක්ෂා කෙරේ. ලියාපදිංචි සියලු වෛද්‍යවරුන්ගේ තොරතුරු www.amc.ayurveda.gov.lk නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට එක් කර ඇත. 2009 වර්ෂයේ වෛද්‍ය සභාවේ අනුමැතිය මත මෙම වෙබ් අඩවිය 2010-09-07 වන දින ආරම්භ කරන ලදී.




# www.amc.ayurveda.gov.lk


## 06. ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

අංක 1884/36 දරන ගැසට් නිවේදනය අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා වසර 05 ක් සම්පූර්ණ වී ඇති වෛද්‍යවරුන් තම ලියාපදිංචිය අලුත් කිරීම සිදු කළ යුතුය. නියමිත දිනට ලියාපදිංචිය අලුත් කර නොමැති වෛද්‍යවරුන් වාර්ෂිකව අයකරනු ලබන ප්‍රමාද ගාස්තුවකට යටත් වනු ඇත.

වගු අංක 6.1

| අයිතමය | | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| ලියාපදිංචිය අළුත් කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | සර්වාංග | 697 | 360 | 542 | 945 | 1562 |
| | විශේෂ | 554 | 222 | 195 | 294 | 406 |
| එකතුව | | **1251** | **582** | **737** | **1239** | **1968** |

ප්‍රස්ථාර අංක 6.1



## 07. ආයුර්වේද සාත්තු සේවකයින් හා භෙෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම

| අයිතමය | 2015.12.31 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | ලියාපදිංචි මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | ලියාපදිංචි මුළු සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | |
| ආයුර්වේද සාත්තු සේවකයින්, භෙද නිලධාරින් | 30 | - | - | 08 | - | 01 | 39 |
| භෙෂජ්‍යකවරුන් | 216 | 32 | 03 | - | 09 | - | 260 |

## 08. ආයුර්වේද වෛද්‍ය සභාවේ මානව සම්පත්

ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමත කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | 2024-12-31 දිනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය | 2024-12-31 දිනට පුරප්පාඩු කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| ලේඛකාධිකාරි (කොන්ත්‍රාත් පදනම) | 01 | 00 | 01 |
| කළමනාකරණ සහකාර | 11 | 07 | 04 |
| ලේඛන භාරකරු | 01 | 00 | 01 |
| කාර්යාල කාර්ය සහයක | 01 | 01 | 00 |
| කම්කරු | 02 | 01 | 01 |
| එකතුව | 16 | 09 | 07 |

## 09. 2024 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් කටයුතු

9.1. රජයේ හා පෞද්ගලික ආයතනවල සේවයේ නියුතු නිලධාරින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදුකිරීම.

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව | 430 | 512 | 353 | 153 | 424 |

එක් එක් රාජ්‍ය ආයතනවල විගණන විමර්ශන වලින් සපයා ඇති දත්ත අනුව සාවද්‍ය වෛද්‍ය සහතික නිකුත් කරන සැක සහිත වෛද්‍යවරුන් වෙත දින 14 ක් ඇතුළත ආයුර්වේද වෛද්‍ය සභාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රතිචාර නොදැක් වූ වෛද්‍යවරුන් විසින් නිකුත් කරන වෛද්‍ය සහතික පිළිනොගැනීමට කටයුතු කර ඒ බව අදාළ ආයතන දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමඟින් සාවද්‍ය ලෙස නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික අවම කර ගැනීමට හැකි වී ඇත.

වෛද්‍ය සහතික තහවුරු කිරීම් සඳහා බොහෝ අවස්ථාවල ඉතා දුර බැහැර ප්‍රදේශවල සිට රෝගීන් ද මෙම තහවුරු කර ගැනීම සඳහා නාවින්න ආයුර්වේද වෛද්‍ය සභාව වෙත පැමිණෙන බවත් එමගින් ඔවුන් බොහෝ අපහසුතාවලට පත්වන බැවින් 2022.09.06 දින ආයුර්වේද වෛද්‍ය සභාවේ තීරණය පරිදි **2022.10.01 දින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික හැර** අනෙකුත් සියළුම වෛද්‍ය සහතික සහතික කිරීම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් හරහා පළාත් ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත හා දිස්ත්‍රික් මූලික රෝහල් වල කාර්යභාර වෛද්‍යවරුන් වෙත පැවරීම සිදු කරන ලදී.

9.2. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 405 | 105 | 571 | 713 | 570 |

9.3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම.

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| වාහන නිල ලාංඡන නිකුත් කිරීම. | 107 | 78 | 106 | 128 | 122 |

9.4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව | 845 | 821 | 1544 | 1946 | 1441 |

9.5. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම කාර්යාල පැවැත්වීම

ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ලබා දෙන සේවාවන් දිස්ත්‍රික්ක මට්ටමින් සැපයීම අරමුණු කර 2024 වර්ෂය වෙනුවෙන් ජංගම සේවාව සිදු කරන ලදී. ප්‍රධාන කාර්යාලයට දුර බැහැර ව වාසය කරනු ලබන සැම දෙනා වෙත මෙම එක් දින ජංගම සේවාව මඟින් පහත සඳහන් සේවාවන් ඉටු කරන ලදී.

i. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචියට අවශ්‍ය අයදුම්පත් නිකුත් කිරීම භාරගැනීම, අයදුම්පත් වල අඩුපාඩු සැකසීම හා ලියාපදිංචි අපේක්ෂිතයින්ගේ ගැටළු විසදීම.
ii. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ විධිවිධාන වලට අනුකූලව මුද්‍රණය කළ ආයුර්වේද වෛද්‍ය සභා ලාංඡනය සහිත ආයුර්වේද වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.
iii. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන ලාංඡන නිකුත් කිරීම.
iv. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
v. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම හා ඊට අදාළ ලිපිය නිකුත් කිරීම
vi. සාරානුකූල සිංහල සහතික පිටපත් නිකුත් කිරීම.
vii. ඉංග්‍රීසි සහතික පිටපත් නිකුත් කිරීම.
viii. නම් වෙනස් කිරීමේ ලිපිය නිකුත් කිරීම.
ix. ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම.
x. චරිත සහතිකය (CERTIFICATE OF GOOD STANDING) නිකුත් කිරීම.

| ස්ථානය | ජංගම කාර්යාලය සඳහා සහභාගී පිරිස |
|---|---|
| 1. 2024.02.01 - දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස් කාර්යාලය | 139 |
| 2. 2024.05.31 - වයඹ පළාත් ආයුර්වේද කොමසාරිස් කාර්යාලය | 90 |
| 3. 2024.08.09, 10,11 නගර සභාව ජංගම කාර්යාල, ගාල්ල පැවති දේ ආ සුබී දක්ෂිණ 2024 - ජාත්‍යන්තර ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශනය සහ සම්භාෂාව | 25 |
| **මුළු එකතුව** | **254** |

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2024 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ඉටුකර ගැනීමට නොහැකි වූ කාර්යයන් 2025 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් වැඩි දුරටත් සඳහන් කරමි.

**වෛද්‍ය එම්.ඩී.ජේ. අබේගුණවර්ධන**
සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

දුරකතන - 011-284 4966
ෆැක්ස් - 011-274 6754
විද්‍යුත් ලිපිනය - ayurmc@sltnet.lk

# ආයුර්වේද වෛද්‍ය සභාව
# 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 රුපියල් | | 2024.12.31 රුපියල් | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් ශේෂය | | 9,735,612 | | 9,903,812 | |
| සේවක ණය අත්තිකාරම් | 1 | 2,615,000 | | 1,859,000 | |
| ලැබිය යුතු ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු | 2 | 1,438,530 | | 1,496,540 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | | 99,783 | | 1,022,918 | |
| ලිපිද්‍රව්‍ය තොගය | 3 | 636,819 | | 605,827 | |
| තැපැල් මුද්දර තොග ගිණුම | 4 | 92,160 | | 60,530 | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් | 5 | 55,969 | | 111,682 | |
| | | | 14,673,873 | | 15,060,308 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ (ගත්මිල) | 6 | 7,116,688 | | 7,116,688 | |
| සමුච්චිත ක්ෂය ගිණුම | | (5,797,994) | | (6,012,388) | |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | | | 1,318,694 | | 1,104,300 |
| වාහන ගිණුම | | 764,280 | | 788,180 | |
| වාහන ක්ෂය වෙන්කිරීමේ ගිණුම | | (592,164) | | (635,288) | |
| වාහන ක්ෂය (ශුද්ධ අගය) | | | 172,116 | | 152,892 |
| පාරිතෝෂික දීමනා ආයෝජන | | | 4,838,710 | | 4,783,995 |
| **මුළු වත්කම්** | | | 21,003,392 | | 21,101,495 |
| **බැරකම්** | | | | | |
| **ජංගම බැරකම්** | | | | | |
| විගණන ගාස්තු වෙන්කිරීමේ ගිණුම | | 400,000 | | 440,000 | |
| ඉදිරි වර්ෂය සඳහා ලැබීම් | 7 | 1,920,950 | | 2,292,380 | |
| ගෙවිය යුතු ලිඛිත පරීක්ෂණ ගාස්තු | | 2,500 | | - | |
| උපචිත ගෙවීම් | 8 | 131,766 | | 95,011 | |
| | | | 2,455,216 | | 2,827,391 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීමේ ගිණුම | | | 4,838,710 | | 4,783,995 |
| **මුළු බැරකම්** | | | 7,293,926 | | 7,611,386 |
| **ශුද්ධ වත්කම්** | | | 13,709,466 | | 13,490,109 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | | | |
| ප්‍රාග්ධනය හා සංචිතය *** | 9 | | 6,974,628 | | 13,708,738 |
| අඩු කළා / එකතු කළා | | | | | |
| පෙරවර්ෂ ගැලපීම මත වෙනස්වීම | | | - | | - |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය | | | 6,734,838 | | (218,629) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | 13,709,466 | | 13,490,109 |

*** සටහන 09 අනුව සිදු කරන ලද ගැලපීම මත 2024 ආරම්භක ප්‍රාග්ධන සංචිතයේ ආරම්භක ශේෂයේ වෙනස සිදුවී ඇත.

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශණය රජයේ ගිණුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ජ්.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

R. L. R. Gunawardena.

වෛද්‍ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

වෛද්‍ය ආර්.එල්.ආර්. ගුණවර්ධන
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව
## 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විස්තරය | සටහන | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|---|
| | | රුපියල් | රුපියල් |
| ආදායම | | | |
| 01. රජයේ ප්‍රදාන | | 5,346,000 | 0 |
| 02. මෙහෙයුම් ආදායම් | 10 | 17,786,676 | 17,604,072 |
| 03. මූල්‍ය ආදායම් | 11 | 1,105,917 | 596,016 |
| 04. විවිධ ආදායම | 12 | 30,190 | 145,670 |
| 05. මුළු ආදායම | | **24,268,783** | **18,345,758** |
| | | | |
| වියදම | | | |
| 06. මෙහෙයුම් වියදම් | 13 | 4,816,597 | 4,665,256 |
| 07. ආයතන හා පරිපාලන වියදම් | 14 | 12,567,861 | 13,693,634 |
| 08. වෙනත් වියදම් | 15 | 149,487 | 205,498 |
| 09. මුළු වියදම | | **17,533,945** | **18,564,387** |
| වාර්ෂික ඌණතාවය / අතිරික්තය | | **6,734,838** | **-218,629** |
| | | | |

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශණය රජයේ ගිණුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

R. L. R. Gunawardhana

වෛද්‍ය ආර්.එල්.ආර්. ගුණවර්ධන
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව
# 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | සටහන | ප්‍රාග්ධනය හා සංචිතය | පෙරවර්ෂ ගැලපුම් ගිණුම | සමුච්චිත ලාභය / අලාභය | මුළු ශුද්ධ ප්‍රාග්ධන හා සංචිත |
|---|---|---|---|---|---|
| 2024.01.01 දිනට ඉදිරියට ගෙන ආ සංශෝධිත ශේෂය | | 2,305,196 | - | 11,404,270 | 13,709,466 |
| පෙරවර්ෂ ගැලපීම මත වෙනස්වීම | 9 | | | (728) | (728) |
| 2024.01.01 දිනට නැවත ප්‍රකාශිත ශේෂය | | 2,305,196 | | 11,403,542 | 13,708,738 |
| කාලච්ඡේදය සඳහා වූ ශුද්ධ වත්කම්වල වෙනස්වීම | | | | | |
| දේපල ප්‍රත්‍යාගණනය මත අතිරික්ත | | - | - | - | - |
| ආයෝජන ප්‍රත්‍යාගණනය මත අලාභ | | - | - | - | - |
| කාලච්ඡේදය සඳහා හඳුනාගත් අතිරික්තය / ඌණතාවය | | - | - | (218,629) | (218,629) |
| 2024.12.31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය | | 2,305,196 | - | 11,184,913 | 13,490,109 |

ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශණය රජයේ ගිණුම් කරන ප්‍රමිතයන්ට අනුව නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

වෛද්‍ය ආර්.එල්.ආර්. ගුණවර්ධන
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව
## 2024.12.31 දින දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| අයිතමය | සටහන | 2023 වර්ෂය | | | 2024 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අඩුවීම | වැඩිවීම | | අඩුවීම | වැඩිවීම | |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම</u> | | | | | | | |
| පොලී ආදායමට පෙර අතිරික්තය | | | | 6,758,138 | | | (218,629) |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම** | | | | | | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | | 1,013,381 | | | 507,031 | - | |
| කාර්ය මණ්ඩල ණය පොළිය | | 92,536 | | | 88,986 | - | |
| වාහන ක්ෂය | | | 48,545 | | - | 43,123 | |
| වාර්ෂික ක්ෂය | | | 261,207 | | - | 214,394 | |
| වාර්ෂික පාරිතෝෂික දීමනා ගාස්තු | | | 374,850 | | - | 1,479,305 | |
| | | 1,105,917 | 684,602 | (421,315) | 596,016 | 1,736,823 | 1,140,806 |
| **මෙහෙයුම් අතිරික්තය** | | | | 6,336,823 | | | 922,177 |
| පෙර වර්ෂයන්ට අදාළ ගෙවීම | 9 | | | (2,480,321) | | | (728) |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස් වීම** | | | | | | | |
| සේවක ණය අත්තිකාරම් | | 419,000 | | | - | 756,000 | |
| අත්තිකාරම් ගෙවීම් ( රජයේ කර්මාන්ත ශාලාව) | | | 96,485 | | - | - | |
| ලැබිය යුතු ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු | | 1,438,530 | | | 58,010 | - | |
| ලිපිද්‍රව්‍ය තොගය | | 252,539 | | | - | 30,992 | |
| තැපැල් මුද්දර තොග ගිණුම | | 36,985 | | | - | 31,630 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | | | 236,536 | | 923,135 | - | |
| උපචිත ගාස්තු | 16 | 61,703 | 83,256 | | 40,771 | 44,016 | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් | 17 | 22,215 | 21,701 | | 55,713 | - | |
| ඉදිරි වර්ෂය සඳහා ලැබීම් | 18 | 351,900 | 536,450 | | 165,225 | 536,655 | |
| ගෙවිය යුතු ලිඛිත පරීක්ෂණ ගාස්තු | | 3,000 | | | 2,500 | - | |
| ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා ගාස්තු | | 1,220 | | | - | - | |
| | | 2,587,093 | 974,428 | (1,612,665) | 1,245,354 | 1,399,293 | 153,939 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | 2,243,837 | | | 1,075,388 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය</u> | | | | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | | 120,435 | | | 23,900 | | |
| කාර්ය මණ්ඩල ණය පොළිය | | | 92,536 | | | 88,986 | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | | | 1,013,381 | | | 507,031 | |
| වාර්ෂික පාරිතෝෂික දීමනා ආයෝජන | | 394,055 | | | 1,479,305 | | |
| | | 514,490 | 1,105,917 | 591,427 | 1,503,205 | 596,016 | (907,189) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | 2,835,264 | | | 168,200 |
| <u>මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය</u> | | | | - | | | - |
| **මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම / වැඩිවීම** | | | | 2,835,264 | | | 168,200 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන විෂයන් - බැංකු ගිණුම | | | | 6,900,349 | | | 9,735,612 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන විෂයන් - බැංකු ගිණුම | | | | **9,735,612** | | | **9,903,812** |
| | | | | 9,735,612 | | | 9,903,812 |
| වර්ෂය අවසානයේ බැංකු ශේෂය | | | | 9,735,612 | | | 9,903,812 |

සකස් කළේ -
ප්‍රභාත් ගුණසේකර
මූල්‍ය සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වෛද්‍ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

වෛද්‍ය ආර්.එල්.ආර්. ගුණවර්ධන
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

## ආයුර්වේද වෛද්‍ය සභාව
## 2024.12.31 දිනට අදාළව අවසාන ගිණුම් පිළිබඳ සටහන් පත්‍රය

**1. නිත්‍ය පිහිටීම -**

| | | |
|---|---|---|
| i. | නම | - ආයුර්වේද වෛද්‍ය සභාව |
| ii. | ලිපිනය | - පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම. |
| iii. | විද්‍යුත් ලිපිනය | - ayurmc@sltnet.lk |
| iv. | වෙබ් අඩවිය | - amc.ayurveda.gov.lk |
| v. | දුරකතන | - 011-284 4966 ෆැක්ස් අංකය - 011-274 6754 |

**2. බැංකුකරුවෝ -**

1. ලංකා බැංකුව, (ප්‍රධාන බැංකුකරු), මහරගම
2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ඉතුරුම් නිවස, ප්‍රධාන කාර්යාලය, කොල්ලුපිටිය.

**3. විගණකයින් -** විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, නො.306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

**4. මෙහෙයුම් ස්වභාවය -**

i. **දැක්ම** - ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා ආයුර්වේදය

ii. **මෙහෙවර** - වෘත්තීය ආචාරධර්මවලට අනුගත වෙමින් උපරිම සෞඛ්‍ය සේවාවක් සලසමින් ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

iii. **පරමාර්ථ** - 1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි විධිවිධානවලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත වෘත්තිකයින් වෙත නෛතික අධිකාරිත්වය පිරිනැමීම සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

**iv. අභිමතාර්ථ ( ක්‍රියාකාරකම් )**

1. 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති වගකීම් ක්‍රියාත්මක කිරීම

   i. ආයතනික උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.(BAMS/BSMS/BUMS)
   ii. ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.
   iii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉන්දියානු විශ්ව විද්‍යාලයක විදේශ සුදුසුකම්ලත් වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.
   iv. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.
   v. ආයුර්වේද හෙද නිලධාරීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම,
   vi. ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම,
   vii. ආයුර්වේද සම්භාහන ශිල්පීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම

2. ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම.
3. ආයුර්වේද වෛද්‍යවරුන්/ හෙද නිලධාරීන්/ ඖෂධවේදීන්/ සම්භාහන ශිල්පීන්ගේ වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම
4. වෙබ් අඩවිය යාවත් කාලීන කිරීම.
5. විශේෂිත වැඩසටහන් (වෘත්තිය සංවර්ධන වැඩසටහන්)
6. ආයුර්වේද වෛද්‍ය සභාවේ භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
7. ආයුර්වේද වෛද්‍ය මුලා ප්‍රකාශන පිළියෙල කිරීම
8. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම කාර්යාල පැවැත්වීම

iii. මිත්‍රශීලී සේවාවක් තුළින් දේශීය වෛද්‍ය ක්‍රමය සුරක්ෂිත කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් ආයුර්වේද විෂයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්, ආයුර්වේද සංරක්ෂණ සහා ලියාපදිංචි හා ලියාපදිංචිය අපේක්ෂිත තැනැත්තන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

iv. ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් වරින්වර ගනු ලබන තීරණ පිළිබඳව ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 5. ව්‍යවස්ථාපිත තත්වය හා නෛතික ස්වභාවය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශයක් අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. පසුව 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ යළිත් ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31දරන ආයුර්වේද පනත, 1977අංක 07 දරන සංශෝධන හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අනුව යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

## 6. ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද හෙද හෙදියන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද ඖෂධවේදීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈඅ). ආයුර්වේද සම්භාහන ශිල්පීන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1.ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද හෙද හෙදියන්, ආයුර්වේද ඖෂධවේදීන් සහ ආයුර්වේද සම්භාහන ශිල්පීන්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,
2. ඉහතින් සඳහන් (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

## 7. වාර්තා කිරීමේ පදනම

I. **වාර්තාකරණ කාලපරිච්ඡේදය**
2024 ජනවාරි 01 සිය දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

II. **අනුකූලතා ප්‍රකාශනය**
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කිරීම සිදු කරයි. ආයුර්වේද වෛද්‍ය සභාවේ ගිණුම් සකස් කිරීම උපචිත පදනමින් සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

III. **ආදායම් හඳුනාගැනීම**
ආදායම් ලැබිය යුතු කාලසීමාව සළකා මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

IV. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**
වත්කමකට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දෙපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

V. **දේපල, පිරියත හා උපකරණ සංචිතය**
මෙම සංචිත ගිණුම දේපල, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

VI. **මුදල් හා මුදල් සමාන දෑ**
2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය දේශීය ව්‍යවහාර මුදල් නොට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

VII. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම**
2024 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යොදා ගනිමින් සකස් කර ඇත.

## සටහන 01 - සේවක ණය අත්තිකාරම්

| නිලධාරියාගේ නම | ආරම්භක ණය ශේෂය 2024.01.01 | විශේෂ අත්තිකාරම් | උත්සව අත්තිකාරම් | ආපදා ණය | වර්ෂය තුළ මුළු ණය ලබා ගැනීම් | වර්ෂය තුළ අයකිරීම් | ගෙවීමට ඇති මුදල 2024.12.31 |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය තුළ ලබා ගත් ණය අත්තිකාරම් | | | | | |
| චමිලා කුමාරසිංහ මිය | 250,000.00 | - | 10,000.00 | - | 10,000.00 | 190,000.00 | 70,000.00 |
| රවී ප්‍රනාන්දු මයා | 245,000.00 | - | - | - | - | 245,000.00 | - |
| සීතා රත්නසීලී මිය | 250,000.00 | - | 10,000.00 | 80,000.00 | 90,000.00 | 150,000.00 | 190,000.00 |
| ප්‍රභාත් ගුණසේකර මයා | 250,000.00 | - | 10,000.00 | - | 10,000.00 | 130,000.00 | 130,000.00 |
| නලින් ගමගේ මයා | 226,000.00 | - | 10,000.00 | - | 10,000.00 | 236,000.00 | - |
| නයනා පියසෝම මිය | 250,000.00 | 4,000.00 | 10,000.00 | - | 14,000.00 | 86,000.00 | 178,000.00 |
| සේපාලි විමලදාස මිය | 214,000.00 | 4,000.00 | 10,000.00 | 96,000.00 | 110,000.00 | 94,000.00 | 230,000.00 |
| ශ්‍රීමා නවරත්න මිය | 245,000.00 | 4,000.00 | 10,000.00 | 55,000.00 | 69,000.00 | 74,000.00 | 240,000.00 |
| ඉරුදිනී රාජපක්ෂ මිය | 195,000.00 | - | - | - | - | 60,000.00 | 135,000.00 |
| තොෂාෂි නිලන්ෂි මිය | - | - | - | 250,000.00 | 250,000.00 | 10,000.00 | 240,000.00 |
| සුනිල් ශාන්ත මයා | 245,000.00 | 4,000.00 | 10,000.00 | 45,000.00 | 59,000.00 | 78,000.00 | 226,000.00 |
| සුරේඛා අමරසිංහ මිය | 245,000.00 | 4,000.00 | 10,000.00 | 45,000.00 | 59,000.00 | 84,000.00 | 220,000.00 |
| | **2,615,000.00** | **20,000.00** | **90,000.00** | **571,000.00** | **681,000.00** | **1,437,000.00** | **1,859,000.00** |
| | | | | | | | |

| | | |
|---|---|---|
| 2024-01-01 දිනට ශේෂය | 2,615,000.00 | |
| වර්ෂය තුළ ලබා දුන් ණය | 681,000.00 | 3,296,000.00 |
| 2024 වර්ෂය තුළ ණය අයකිරීම | | 1,437,000.00 |
| 2024-12-31 දිනට ශේෂය | | **1,859,000.00** |

## සටහන 02 - ලැබිය යුතු ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු

ලියාපදිංචිය අලුත් කිරීම සිදු කළ යුතු වෛද්‍යවරුන් ගේ සංඛ්‍යා ලේඛනය
2014 ඔක්තෝබර් 15 දිනැති 1884/36 අති විශේෂ ගැසට් නිවේදනය

මෙම ගැසට් නිවේදනයෙන් පසුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති මේ වන විට වසර පහක් සම්පූර්ණ වී ලියාපදිංචිය අලුත් කර නොමැති වෛද්‍යවරුන්ගේ තොරතුරු අනුව මෙම ගණනය කිරීම සිදු කර ඇත.

**සාමාන්‍ය (සර්වාංග)**

| වර්ෂය | වාර්ෂික ලියාපදිංචිය | ලියාපදිංචිය අලුත් කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචිය අලුත් කළ යුතු සංඛ්‍යාව | ලියාපදිංචි ගාස්තුව | දඩ මුදල | | එක් වෛද්‍යවරයෙකු ගෙන් අය විය යුතු මුදල | අලුත් කිරීමේ ගාස්තුව | දඩ මුදල | අය විය යුතු මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 272 | 167 | 105 | 1,800.00 | 350*5 | 1,750.00 | 3,550.00 | 189,000.00 | 183,750.00 | 372,750.00 |
| 2015 | 211 | 143 | 68 | 1,800.00 | 350*4 | 1,400.00 | 3,200.00 | 122,400.00 | 95,200.00 | 217,600.00 |
| 2016 | 268 | 212 | 56 | 1,800.00 | 350*3 | 1,050.00 | 2,850.00 | 100,800.00 | 58,800.00 | 159,600.00 |
| 2017 | 112 | 87 | 25 | 1,800.00 | 350*2 | 700.00 | 2,500.00 | 45,000.00 | 17,500.00 | 62,500.00 |
| 2018 | 312 | 231 | 81 | 1,800.00 | 350*1 | 350.00 | 2,150.00 | 145,800.00 | 28,350.00 | 174,150.00 |
| 2019 | 278 | 181 | 97 | 1,800.00 | 350*0 | - | 1,800.00 | 174,600.00 | - | 174,600.00 |
| එකතුව | **1453** | **1021** | **432** | | | | | **777,600.00** | **383,600.00** | **1,161,200.00** |

**විශේෂ**

| වර්ෂය | වාර්ෂික ලියාපදිංචිය | ලියාපදිංචිය අලුත් කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචිය අලුත් කළ යුතු සංඛ්‍යාව | ලියාපදිංචි ගාස්තුව | දඩ මුදල | | එක් වෛද්‍යවරයෙකු ගෙන් අය විය යුතු මුදල | අලුත් කිරීමේ ගාස්තුව | දඩ මුදල | අය විය යුතු මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 174 | 116 | 58 | 1,080.00 | 350*5 | 1,750.00 | 2,830.00 | 62,640.00 | 101,500.00 | 164,140.00 |
| 2015 | 38 | 20 | 18 | 1,080.00 | 350*4 | 1,400.00 | 2,480.00 | 19,440.00 | 25,200.00 | 44,640.00 |
| 2016 | 142 | 106 | 36 | 1,080.00 | 350*3 | 1,050.00 | 2,130.00 | 38,880.00 | 37,800.00 | 76,680.00 |
| 2017 | 12 | 8 | 4 | 1,080.00 | 350*2 | 700.00 | 1,780.00 | 4,320.00 | 2,800.00 | 7,120.00 |
| 2018 | 44 | 36 | 8 | 1,080.00 | 350*1 | 350.00 | 1,430.00 | 8,640.00 | 2,800.00 | 11,440.00 |
| 2019 | 74 | 45 | 29 | 1,080.00 | 350*0 | - | 1,080.00 | 31,320.00 | - | 31,320.00 |
| එකතුව | **484** | **331** | **153** | | | | | **165,240.00** | **170,100.00** | **335,340.00** |
| **මුළු එකතුව** | **1937** | **1352** | **585** | | | | | **942,840.00** | **553,700.00** | **1,496,540.00** |

සටහන 03 - ලිපිද්‍රව්‍ය තොගය

| අංකය | අයිතමය | ඉතිරිව ඇති | ඒකක මිල | එකතුව |
|---|---|---|---|---|
| | | ප්‍රමාණය | රු. | රු. |
| 1 | **Awimp offset colours viole 170 gsm A4** | 30 | 15.00 | 450.00 |
| 2 | **AA - Battary** | 0 | 0.00 | 0.00 |
| 3 | **AAA - Battary** | 0 | 0.00 | 0.00 |
| 4 | **Binding tape 2 Blue** | 5 | 308.00 | 1540.00 |
| 5 | **Binding tape 2 Black** | 6 | 368.00 | 2208.00 |
| 6 | **Box file** | 10 | 169.57 | 1695.70 |
| 7 | **Carbon Paper Packet** | 2 | 969.49 | 1938.98 |
| | | 2 | 469.00 | 938.00 |
| 8 | **CD** | 51 | 19.50 | 994.50 |
| 9 | **CD Case** | 81 | 20.00 | 1620.00 |
| 10 | **Celotape 1** | 5 | 110.94 | 554.70 |
| 11 | **Celotape 2** | 2 | 128.70 | 257.40 |
| | | 10 | 148.31 | 1483.10 |
| 12 | **Clips Packet** | 7 | 105.00 | 735.00 |
| 13 | **CR book 1** | 6 | 104.36 | 626.16 |
| 14 | **CR book 2** | 4 | 107.00 | 428.00 |
| 15 | **CR book 3** | 7 | 300.87 | 2106.09 |
| 16 | **CR book 4** | 8 | 82.50 | 660.00 |
| 17 | **CR book 5** | 4 | 171.85 | 687.40 |
| 18 | **CR book 6** | 0 | 0.00 | 0.00 |
| 19 | **Ereser** | 2 | 8.90 | 17.80 |
| | | 10 | 18.68 | 186.80 |
| 20 | **Envelop 6x3** | 1950 | 1.85 | 3607.50 |
| 21 | **Envelop 9x4** | 2000 | 3.75 | 7500.00 |
| 22 | **Envelop 9x5** | 100 | 1.60 | 160.00 |
| | | 500 | 5.40 | 2700.00 |
| 23 | **Envelop 10x7** | 2350 | 2.40 | 5640.00 |
| 24 | **Envelop 10x12** | 2115 | 3.80 | 8037.00 |
| 25 | **Envelop 10x15** | 1250 | 4.90 | 6125.00 |
| | | 350 | 14.50 | 5075.00 |
| 26 | **File Tag** | 12 | 528.00 | 6336.00 |
| 27 | **File - Pink** | 1000 | 76.40 | 76400.00 |
| 28 | **File - Blue** | 500 | 15.00 | 7500.00 |
| 29 | **File - Yellow** | 1000 | 76.40 | 76400.00 |
| | | 100 | 15.00 | 1500.00 |
| 30 | **File - Normal** | 300 | 3.90 | 1170.00 |
| 31 | **File - 4 hole** | 5 | 80.00 | 400.00 |
| 32 | **File - Cetificate** | 300 | 86.94 | 26082.00 |
| 33 | **Glue Bottal** | 2 | 328.00 | 656.00 |
| | | 2 | 60.00 | 120.00 |
| 34 | **Hi Lighter Pen - Yellow** | 4 | 134.50 | 538.00 |
| 35 | **Hi Lighter Pen - Green** | 1 | 37.50 | 37.50 |
| | | 1 | 139.13 | 139.13 |
| | | 5 | 134.50 | 672.50 |
| 36 | **Hero Stamp pad** | 3 | 75.00 | 225.00 |
| 37 | **Laminating Paper A4** | 0 | 0.00 | 0.00 |
| 38 | **Laminating Paper A5** | 400 | 12.50 | 5000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 39 | Not book | 408 | 45.00 | 18360.00 |
| 40 | Pad ink bottle | 1 | 165.00 | 165.00 |
| | | 5 | 130.00 | 650.00 |
| 41 | Pencil | 6 | 11.25 | 67.50 |
| | | 24 | 15.07 | 361.68 |
| 42 | Pen - Blue | 75 | 26.15 | 1961.25 |
| 43 | pen - Black | 33 | 26.15 | 862.95 |
| 44 | Pen Red | 16 | 27.83 | 445.28 |
| | | 50 | 26.15 | 1307.50 |
| 45 | Pen - Permanent | 1 | 128.70 | 128.70 |
| | | 5 | 93.35 | 466.75 |
| 46 | pins packet | 7 | 160.00 | 1120.00 |
| 47 | Photo copy - White | 73 | 1346.46 | 98291.58 |
| 48 | Photo copy - Peach | 4 | 1015.00 | 4060.00 |
| | | 5 | 932.18 | 4660.90 |
| 49 | Photo copy - ivory | 2 | 1235.00 | 2470.00 |
| 50 | Photo copy - Green | 2 | 1235.00 | 2470.00 |
| 51 | Photo copy - Blue | 2 | 693.92 | 1387.84 |
| 52 | Photo copy - Yellow | 8 | 693.92 | 5551.36 |
| 53 | Photo copy - Pink | 4 | 932.18 | 3728.72 |
| 54 | Red tape | 10 | 81.00 | 810.00 |
| 55 | Ronio Packet | 2 | 285.00 | 570.00 |
| 56 | Ruler | 5 | 62.61 | 313.05 |
| 57 | Steples Packet - Big | 14 | 78.70 | 1101.80 |
| | | 25 | 73.04 | 1826.00 |
| 58 | Steples Packet - Small | 12 | 10.00 | 120.00 |
| 59 | Sticker Paper A4 | 227 | 7.50 | 1702.50 |
| 60 | Stick Note | 3 | 146.09 | 438.27 |
| | | 5 | 170.00 | 850.00 |
| 61 | Stick Pad | 2 | 57.50 | 115.00 |
| 62 | Tipex | 2 | 128.71 | 257.42 |
| 63 | Toner - Photo copy (Mp 2001) | 1 | 27800.00 | 27800.00 |
| 64 | Toner - Photo copy NPG 73 | 1 | 67100.00 | 67100.00 |
| 65 | Toner - Photo copy Hp 80- A | 1 | 46250.00 | 46250.00 |
| 66 | Toner - Computer 326 | 1 | 11250.00 | 11250.00 |
| 67 | Toner - Lexmark Ms 312 | 2 | 15500.00 | 31000.00 |
| 68 | Toner - Canon Fax 051 | 0 | 0.00 | 0.00 |
| 69 | White Board Marker - Black | 2 | 52.92 | 105.84 |
| 70 | White Board Marker * Blue | 1 | 32.92 | 32.92 |
| 71 | A4 Shine Sheet | 60 | 75.00 | 4500.00 |
| 72 | Binder Clips 41 mm | 3 | 6.30 | 18.90 |
| 73 | Ledger Book | 0 | 0.00 | 0.00 |
| | **Total** | | | **605,826.97** |

**සටහන 04 - තැපැල් මුද්දර තොගය**

| මුද්දර වර්ගය | ඉතිරි ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|
| 110/- | 370 | 40,700.00 |
| 50/- | 280 | 14,000.00 |
| 25/- | 146 | 3,650.00 |
| 10/- | 122 | 1,220.00 |
| 5/- | 192 | 960.00 |
| **එකතුව** | | **60,530.00** |

**සටහන 05 – ඉදිරිවර්ෂය සඳහා ගෙවීම්**

| | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු | 2,366 | 25,282 |
| ඉදිරි වර්ෂය දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | - | - |
| ඉදිරි වර්ෂය සඳහා කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු | 53,603 | 86,400 |
| | **55,969** | **111,682** |

**සටහන 06 - දේපල, පිරියත හා උපකරණ**

| | |
|---|---|
| **ගිණුම් ඉදිරිපත් කිරීම** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ගිණුම් සකස් කර ඇත. |
| **ක්ෂය ක්‍රමය** | සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙනය. |
| **ක්ෂය අනුපාතය** | • වත්කම වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්ත ද එම අදාළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය ගණන් බලනු ලැබේ.<br>• වත්කම වර්ෂයේ කුමන දිනයක ඉවත් කළ ද එම ඉවත් කළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය ගණන් බලනු නොලැබේ.<br>• ලී බඩු හා සවිකිරීම් 12%<br>• වාහන 22%<br>• කාර්යාල උපකරණ 22% |

**ආයුර්වේද වෛද්‍ය සභාව**

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල, උපකරණ හා පිරියත**

| | ලී බඩු හා සවිකිරීම් | කාර්යාල උපකරණ | වාහන | එකතුව |
|---|---|---|---|---|
| **ගත්මිල** | | | | |
| 2024.01.01 දිනට ශේෂය | 2,861,420.95 | 4,255,267.06 | 764,280.00 | 7,880,968.01 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - | 23,900.00 | 23,900.00 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - |
| 2024.12.31 දිනට ශේෂය | **2,861,420.95** | **4,255,267.06** | **788,180.00** | **7,904,868.01** |
| | | | | |
| **සමුච්චිත ක්ෂය** | | | | |
| 2024.01.01 දිනට සමුච්චිත ක්ෂය | 2,120,651.16 | 3,677,342.90 | 592,164.45 | 6,390,158.51 |
| 2024 වර්ෂය සඳහා ක්ෂය | 88,892.37 | 125,501.85 | 43,123.42 | 257,517.64 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | - | - | - |
| 2024.12.31 දිනට සමුච්චිත ක්ෂය | **2,209,543.53** | **3,802,844.75** | **635,287.87** | **6,647,676.15** |
| | | | | |
| 2024.12.31 දින ශුද්ධ වටිනාකම | **651,877.42** | **452,422.31** | **152,892.13** | **1,257,191.86** |

**සටහන -07 - ඉදිරිවර්ෂය සඳහා ලැබීම්**

| | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| ඉදිරි වර්ෂය සඳහා හැඳුනුම්පත් ගාස්තු ගාස්තු ලැබීම් | 112,400 | 549,380 |
| ඉදිරි වර්ෂය තැපැල් ගාස්තු ලැබීම් | 600 | - |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි අයැදුම්පත් ගාස්තු ලැබීම් | 2,700 | - |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු | 22,875 | - |
| ඉදිරි වර්ෂය සඳහා ලිඛිත පරීක්ෂණ ගාස්තු | 743,400 | 607,950 |
| ඉදිරි වර්ෂය සඳහා වාහන ලාංඡන ගාස්තු | 9,000 | 22,050 |
| ඉදිරි වර්ෂය සඳහා සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 1,026,375 | 1,113,000 |
| ඉදිරි වර්ෂය සඳහා නම් වෙනස්කිරීමේ ගාස්තු | 3,600 | - |
| | **1,920,950** | **2,292,380** |

**සටහන - 08 - උපචිත**

**වියදම්**

| | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| උපචිත දුරකතන වියදම් | 8,353 | 8,197 |
| උපචිත අතිකාල වියදම් | 9,914 | 11,261 |
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | 19,500 | - |
| උපචිත විදුලි ගාස්තු | 24,347 | 10,729 |
| උපචිත වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු | - | - |
| උපචිත සනීපාරක්ෂක සේවා ගාස්තු | 34,155 | 36,823 |
| උපචිත කාර්ය මණ්ඩල දීමනා | 35,497 | 28,000 |
| | **131,766** | **95,011** |

**සටහන - 09 - ප්‍රාග්ධනය හා සංචිතයට ගැලපීම්**

2023 වර්ෂයට අදාළව ආයුර්වේද වෛද්‍ය සභාවේ ගිණුම් විගණන සඳහා ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු විගණන ගාස්තුව

| | |
|---|---|
| 2024.01.01 ප්‍රාග්ධනය හා සංචිත | 13,709,466 |
| ඌණ විගණන ගාස්තු වෙන්කිරීම ගැලපීම | (728) |
| 2024.01.01 දිනට නැවත ප්‍රකාශිත ශේෂය | **13,708,738** |

**සටහන - 10 - මෙහෙයුම් ආදායම්**

| විස්තරය | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ආදායම | 37,800 | 96,250 |
| ලියාපදිංචි අයැදුම්පත් නිකුත් කිරීමේ ආදායම | 2,830,890 | 3,017,257 |
| චරිත සහතික | 137,000 | 113,000 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 1,352,450 | 1,114,575 |
| වෛද්‍ය සහතික සහිතක කිරීමේ ආදායම | 62,300 | 147,300 |
| සහතික පිටපත් නිකුත් කිරීමේ ආදායම | 441,000 | 458,400 |
| නම් වෙනස් කිරීමේ ආදායම | 81,600 | 50,400 |
| වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීමේ ආදායම | 922,340 | 691,680 |
| වාහන ලාංඡන නිකුත් කිරීමේ ආදායම | 401,900 | 393,300 |
| හැඳුනුම්පත් නිකුත් කිරීමේ ආදායම | 1,475,200 | 1,319,375 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු ආදායම | 949,490 | 1,225,880 |
| නාමලේඛන පිටපත් ගාස්තු | 8,240 | 1,770 |
| තැපැල් ගාස්තු ආදායම | 315,061 | 320,715 |
| ලියාපදිංචි අංකය තහවුරු කිරීමේ ආදායම | 14,500 | 24,600 |
| ලියාපදිංචි ගාස්තු ආදායම | 4,042,375 | 3,301,500 |
| ලියාපදිංචිය අළුත් කිරීමේ ආදායම | 4,486,670 | 5,098,050 |
| විෂය නිර්දේශ නිකුත් කිරීමේ ආදායම | 131,160 | 126,820 |
| සත්‍ය පිටපත් බවට සහතික කිරීමේ ආදායම | 96,700 | 103,200 |
| | **17,786,676** | **17,604,072** |

**සටහන - 11 - මූල්‍ය ආදායම්**

| විස්තරය | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| පාරිතෝෂික දීමනා ආයෝජන පොලී ආදායම | 1,013,381 | 507,031 |
| කාර්ය මණ්ඩල ණය පොලී ආදායම | 92,536 | 88,986 |
| | **1,105,917** | **596,016** |

**සටහන - 12 - විවිධ ආදායම**

| විස්තරය | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විවිධ ආදායම් | 30,190 | 145,670 |
| | 30,190 | 145,670 |

**සටහන - 13 - මෙහෙයුම් වියදම්**

| විස්තරය | 20223.12.31 | 20224.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 792,880 | 1,118,000 |
| අනු කමිටු දීමනා | 87,000 | 116,000 |
| සංග්‍රහ වියදම් | 274,116 | 274,746 |
| කුළී රථ හා ඉන්ධන ගාස්තු | 499,876 | 102,040 |
| හැඳුනුම්පත් සකස් කිරීමේ ගාස්තු | 142,014 | 119,633 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 415,250 | 395,650 |
| තැපැල් ගාස්තු | 563,200 | 631,630 |
| මුද්‍රණ ගාස්තු | 538,232 | 473,513 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 599,041 | 692,876 |
| ගමන් වියදම් | 186,734 | 34,991 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 693,920 | 706,178 |
| වාහන අළුත්වැඩියා වියදම් | 24,335 | 0 |
| | 4,816,597 | 4,665,256 |

**සටහන - 14 - ආයතන හා පරිපාලන වියදම්**

| විස්තරය | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| කාර්ය මණ්ඩල වැටුප් | 7,284,451 | 7,376,834 |
| කාර්ය මණ්ඩල දීමනා | 421,897 | 350,000 |
| සභාපති දීමනාව | 450,000 | 450,000 |
| ලේඛකාධිකාරී දීමනා | 85,200 | 78,100 |
| ගණකාධිකාරී දීමනා | 120,000 | 120,000 |
| අතිකාල දීමනා ගාස්තු | 172,730 | 204,900 |
| සේවක අර්ථ සාධක අරමුදල් ගාස්තු | 978,292 | 1,009,479 |
| සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් ගාස්තු | 195,658 | 201,896 |
| වාර්ෂික පාරිතෝෂික දීමනා ගාස්තු | 374,850 | 1,479,305 |
| කාර්ය මණ්ඩල පුහුණු ගාස්තු | 59,500 | 13,000 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු | 618,579 | 603,478 |
| සනීපාරක්ෂක සේවා ගාස්තු | 360,376 | 447,395 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | 22,200 | 0 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 37,600 | 30,800 |
| දුරකතන වියදම් | 96,501 | 126,873 |
| රක්ෂණ ගාස්තු | 18,073 | 29,653 |
| වාර්ෂික විගණන ගාස්තු | 400,000 | 440,000 |
| කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂය ගිණුම | 261,207 | 214,394 |
| වාහන වාර්ෂික ක්ෂය ගිණුම | 48,545 | 43,123 |
| විදුලි ගාස්තු | 562,202 | 474,403 |
| | 12,567,861 | 13,693,634 |

සටහන - 15 - වෙනත් වියදම්

| විස් තරය | 2023.12.31 | 2024.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විවිධ වියදම් | 149,487 | 205,498 |
| | **149,487** | **205,498** |

සටහන - 16 - උපචිත වියදම් විචලනය

| අයිත මය | 2023 වර්ෂය | | 2024 වර්ෂය | |
|---|---|---|---|---|
| | අඩුවීම | වැඩිවීම | අඩුවීම | වැඩිවීම |
| උපචිත කාර්ය මණ්ඩල දීමනා | 903 | | 7,497 | |
| උපචිත ගණකාධිකාරී දීමනා | 40,000 | | | |
| උපචිත විදුලි ගාස්තු | | 11,757 | 13,617 | |
| උපචිත අතිකාල වියදම් | | 9,914 | | 1,348 |
| උපචිත සනීපාරක්ෂක සේවා ගාස්තු | | 10,667 | | 2,668 |
| උපචිත විගණන ගාස්තු | | 30,850 | | 40,000 |
| උපචිත දුරකතන ගාස්තු | | 568 | 156 | |
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | | 19,500 | 19,500 | |
| උපචිත වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 20,800 | | | |
| | **61,703** | **83,256** | **40,771** | **44,016** |

සටහන - 17 - ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් විචලනය

| | | | | |
|---|---|---|---|---|
| ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ ගාස්තු | | 10,601 | 22,916 | |
| ඉදිරි වර්ෂය සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර | | 11,100 | | |
| ඉදිරි වර්ෂය සඳහා කාර්යාල උපකරණ අළුත්වැඩියා ගාස්තු | 22,215 | | 32,797 | |
| | **22,215** | **21,701** | **55,713** | **-** |

සටහන - 18- ඉදිරි වර්ෂය සඳහා ලැබීම් විචලනය

| | | | | |
|---|---|---|---|---|
| ඉදිරි වර්ෂය සඳහා හැඳුනුම්පත් ගාස්තු ගාස්තු ලැබීම් | 57,300 | | | 436,980 |
| ඉදිරි වර්ෂය සඳහා සම්මුඛ පරීක්ෂණ ගාස්තු | | 518,875 | | 86,625 |
| ඉදිරි වර්ෂය සඳහා අයැදුම්පත් ගාස්තු ලැබීම් | | 2,700 | 2,700 | |
| ඉදිරි වර්ෂය සඳහා නම් වෙනස් කිරීමේ ගාස්තු | | 3,600 | 3,600 | |
| ඉදිරි වර්ෂය සඳහා තැපැල් ගාස්තු | | 400 | 600 | |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු | | 7,875 | 22,875 | |
| වාහන ලාංඡන නිකුත් කිරීමේ ආදායම | | 3,000 | | 13,050 |
| ඉදිරි වර්ෂය සඳහා ලිඛිත පරීක්ෂණ ගාස්තු | 294,600 | | 135,450 | |
| | **351,900** | **536,450** | **165,225** | **536,655** |

**සකස් කළේ -**
**ප්‍රභාත් ගුණසේකර**
**මූල්‍ය සහකාර**
**ආයුර්වේද වෛද්‍ය සභාව**

පරීක්ෂා කළේ -
ඒ.එම්.එම්.කේ.අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරී,
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආචාර්ය එම්.ඩී.ජේ.අබේගුණවර්ධන
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්

**වෛද්‍ය ආර්.එල්.ආර්. ගුණවර්ධන**
**ලේඛකාධිකාරී**
**ආයුර්වේද වෛද්‍ය සභාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } MED/A/AMC/01/24/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 අප්‍රේල් 07 දින

සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

2

සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා විධිවිධානවලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටස | |
| (i) 11(1)(ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ සමාජිකයන් තිදෙනෙකු සභාවේ සමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සමාජිකයන් තිදෙනා පත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. |
| (ii) 18(ඇ)හා(ඈ) වගන්ති | 2024 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු හෙද නිලධාරින් සංඛ්‍යාව 39ක් හා හෙසජ්ජකවරුන් සංඛ්‍යාව 260ක්වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීන වී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරින් බඳවා ගෙන පුහුණු කිරීමේ |

4

ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරින් 100ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන තිබුණද, අපේක්ෂිත මට්ටමින් පනතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව් තිබුණි.

(iii) 19(1)(අ) වගන්තිය — සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරිවරයෙකු පත් කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරීවරයකු පත් කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් හා වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත

(i) 38(1)(ඇ) වගන්තිය — සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එවැනි සමාලෝචනයක් සිදුකර නොතිබුණි.

(ii) 38(2) වගන්තිය — පනතේ 38 (I) (ඇ) වගන්තිය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) 40 වගන්තිය — විගණනය කරනු ලබන අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු වුවත් ආයුර්වේද වෛද්‍ය සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණු අතර ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සභාවේ විගණන කටයුතු සිදු කෙරේ.. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඇ) | 2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරුන් 585 ක් ලියාපදිංචිය අළුත් කරගෙන නොතිබුණි. |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු උපායමාර්ගික සැලැස්ම එකී විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය | අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. **වෙනත් කරුණු**

(අ) සභාවේ බැංකු ජංගම ගිණුමේ රුපියල් මිලියන 7ත් 14ත් අතර ශේෂයක් සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ පැවති අතර සාමාන්‍ය දෛනික ගනුදෙනු අවශ්‍යතාවය රඳවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්, 2023 වර්ෂයට අදාළව එක් පැමිණිල්ලක් හා 2024 වර්ෂයේ ලද පැමිණිලි 11න් පැමිණිලි 07ක විමර්ශනයන් අවසන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකළ යුතු ක්‍රියාකාරකම් 44කින් ක්‍රියාකාරකම් 20ක් ආරම්භ කර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 09ක අපේක්ෂිත ප්‍රගතිය කරා ළඟා වී නොතිබුණි. එම කාර්යයන්හි කාර්ය සාධනය සියයට 25ත් සියයට 75ත් අතර පරාසයක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## සංස්ථාපිත තොරතුරු

**නම -** ආයුර්වේද වෛද්‍ය සභාව

**ව්‍යවස්ථාපිත තත්වය -**

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශයක් අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. පසුව 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ යළිත් ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1977අංක 07 දරන සංශෝධන හා 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අනුව සංශෝධනය වී 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

**බැංකුකරුවෝ -**

1. ලංකා බැංකුව, ( ප්‍රධාන බැංකුකරු )
   මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
   ඉතුරුම් නිවස,
   ප්‍රධාන කාර්යාලය,
   කොල්ලුපිටිය.

**විගණකයින් -**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආයුර්වේද වෛද්‍ය සභාව
ஆயுர்வேத வைத்திய சபை
Ayurvedic Medical Council

*"ජීවිත වෙදකුරු මනුවෙනා නිරෝගී දැයයි ශ්‍රී ලංකා"*


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාර්යාලය காரியாலயம் Office | Tel 011-284 4966 011-289 6911/12 Ext - 316 Fax 011-274 6754 | සභාපති தலைவர் Chairman | Tel 011-284 7555 Fax 011-284 5537 | ලේඛකාධිකාරී பதிவாளர் Registrar | Tel 011-284 4966 011-2896911/12 Ext - 201 Fax 011-274 6754 | E- Mail : ayurmc@sltnet.lk Web Site: www.amc.ayurveda.gov.lk |

# ස්තුතිය

**ගරු සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය,**
වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා

**ලේකම්**
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

**අතිරේක ලේකම් (පාලන)**
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය

**ආයුර්වේද වෛද්‍ය සභාවේ සියලුම සාමාජික භවතුන්**

**ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය**

**බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය**

**පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ**

**සියලුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්**

**ජාතික විගණන කාර්යාලය**

**නීතිපති දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**

**තැපැල් දෙපාර්තමේන්තුව**

**සියලුම ජනමාධ්‍ය ආයතන**

**සියලුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

**සියලුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා**

**හා**

**ආයුර්වේද වෛද්‍ය සභා කාර්යය මණ්ඩලය**